# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2181/4 - 2020 ජූනි මස 22 වැනි සඳුදා - 2020.06.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : LD/05/2007/MV/117J.

*මගේ යොමු අංකය* : 6/3/7/15/11/15.

මොරගහකන්ද/කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර :*

මෙහි මහජන කටයුත්තක් යනු මොරගහකන්ද හා කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම වේ.

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ, නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගඟල පල්ලේසිය පත්තුවේ ඇලගමුව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2018.01.29 වන දින සම්මත කරන ලද, භූලක්ෂණාත්මක මූලික පිඹුරු අංකය 18 අතිරේක අංකය 29, පත්‍රය 62 දරන සැලසුමේ පෙන්නුම් කර ඇති පහත විස්තර සඳහන් ඉඩම් කොටස.

01. **කැබලි අංක 2936**

ඉඩමේ නම: අඹගහදෙවොලහේනේයාය; විස්තරය: කැලය; හිමිකම් කියන අය: රජය (වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව) අංක 14, කුළුගම්මන, මහනුවර ලිපිනයේ පදිංචි හීන්බණ්ඩා කුළුගම්මන මයා සහ ජා-ඇල පාර, කිරිදිවිට, ගම්පහ ලිපිනයේ පදිංචි වත්තේගෙදර දුක්ගන්නාරාලලාගේ ඒකනායක බණ්ඩාර මයා විසින් භුක්ති විඳියි; ප්‍රමාණය: හෙක්. 13.8891.

02. **කැබලි අංක 2937**

ඉඩමේ නම: අඹගහදෙවොලහේනේයාය; විස්තරය: කැලය; හිමිකම් කියන අය: රජය (වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව) අංක 14, කුළුගම්මන, මහනුවර ලිපිනයේ පදිංචි හීන්බණ්ඩා කුළුගම්මන මයා සහ ජා-ඇල පාර, කිරිදිවිට, ගම්පහ ලිපිනයේ පදිංචි වත්තේගෙදර දුක්ගන්නාරාලලාගේ ඒකනායක බණ්ඩාර මයා විසින් භුක්ති විඳියි; ප්‍රමාණය: හෙක්. 21.3617.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020.07.21 වැනි දින පූ.භා. 9.00 ට, නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2020.07.14 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ආත්මා දිලුක්ෂි ජයරත්න,
ප්‍රාදේශීය ලේකම්,
නාඋල.

2020 ජූනි මස 17 වැනි දින,
නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 211

**සංශෝධනයයි**

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

**මින්නේරිය ප්‍රදේශයට ඉන්ධන පිරවුම්හලක් ලබාදීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීම සඳහා වන 7 වන වගන්ති ගැසට් පත්‍රයට අදාළ සංශෝධනයක් සිදු කිරීම**

උක්ත කරුණ සම්බන්ධ ව 2019/දෙසැම්බර් මස 09 වැනි දින පළ වූ අංක 2153/4 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ විස්තරයෙහි දෙවන වගන්තියේ පළමුවන උප වගන්තිය යටතේ යන්න හත්වන වගන්තියේ පළමු උප වගන්තිය යනුවෙන් සංශෝධනය විය යුතු බව කාරුණිකව දන්වා සිටිමි.

ආර්. එම්. ඩී. පී පුෂ්ප කුමාරි,
ප්‍රාදේශීය ලේකම්,
හිඟුරක්ගොඩ.

2020 ජුනි මස 15 වැනි දින.

07-214